# ශ්‍රී ලංකාවේ ජාතික අර්බුදය; වර්ධනය සහ විසඳුම් පිළිබඳ දළ ඇගයුමක්

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ටෙරන්ස් පුරසිංහ මහතා

ශ්‍රී ලංකාවේ දෙමළ ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් දේශපාලන විසඳුමක අවශ්‍යතාව මතු වූයේ මෑතකදී නොව නිදහස ලැබූ මුල් කාලයේ පටන්ය. ලාංකීය සමාජය බහුජාතික, බහුවාර්ගික හා බහු ආගමික සමාජයක් වේ. එබඳු සමාජයක් පවත්නා රාජ්‍යයක සුළුජාතීන්ගේ ජාතිකත්වය, ප්‍රදේශික හා සංස්කෘතික අනන්‍යතාව තහවුරු කරමින් ජාතීන් අතර එක්සත් භාවය ඇති කිරීමේ දේශපාලන අවශ්‍යතාව මූලික වන්නකි. විශේෂයෙන්ම දේශපාලන ක්‍රමයක් තුළ බහුතරයේ ප්‍රජාතන්ත්‍රවාදය පමණක් නොව සුළුතරයේ ප්‍රජාතන්ත්‍රවාදයද සාක්ෂාත් කිරීම එක්සත් රාජ්‍යයක් ගොඩ නැඟීමේ පදනම ලෙස හැඳින්විය හැක. මෙහිදී "පාලනය පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියාවලිය" සඳහා සුළු ජාතීන්ද සම්බන්ධ කර ගැනීම තුළින් සුළුතරයේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වන අතර එමගින් ජාතීන් අතර අන්තර් සහයෝගය හා සහෝදරත්වය ස්ථාපිත වේ.

බහුජාතික දේශපාලන සමාජයක මහාජාතිය සුළුජාතීන් ගේ අයිතිවාසිකම් පිළිබඳව සැලකිලිමත් වීමෙන් සුළුජාතීන් මහාජාතිය සමග සහයෝගයෙන් ක්‍රියා කරනු ඇත. එක්සත් බහුජාතික රාජ්‍යයක් ගොඩ නැගිය හැකි වන්නේ එබඳු පසුබිමක් යටතේ පමණි.

ඕනෑම ජාතියක "ජාතිකත්වය" *(Nationality)* තහවුරු වන්නේ රාජ්‍යය පදනම් කරගෙනය. රාජ්‍යයේ දේශසීමාව තුළ ජීවත්වන විවිධ ජනකොටස් තමන් එක් ජාතියකට අයත්වේයැයි කල්පනා කිරීම තුළින් "ජාතිකවාදය" *(Nationalism)* නැමති සංකල්පය නිර්මාණය වේ. එම සංකල්පය පදනම් කරගෙන *One Nation - One Country* හෙවත් එක්ජාතියකට එක් රාජ්‍යයයි යන ප්‍රායෝගික තත්ත්වය ඇතිවී තිබේ. ජාතියක් යනුවෙන් හඳුන්වන්නේ චිරාගත භූමි ප්‍රදේශයක වාසය කරන, වෙන්වූ භාෂාවක් කථාකරන, සංස්කෘතික අනන්‍යතාවක් සහිත, ජාතික ඉතිහාසයකට උරුම කියන ජන කොට්ඨාශයකි. එබඳු ජාතීන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ජීවත්වන රටක් එක්සත් රාජ්‍යයක් වශයෙන් පැවතීම සඳහා මූලික වශයෙන් ජාතීන් අතර සාමානාත්මතාව පිළිබඳ මූලධර්මය පැවතිය යුතුය. මෙකී සමානාත්මතාවය නෛතික වශයෙන් පමණක් නොව ප්‍රායෝගික තලයේද පැවතීම අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන්ම පාලනය පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ නියෝජනය වීමට සෑම ජන කොටසකටම (ජාතියකටම) අවස්ථාව සැලසී තිබිය යුතුය. මෙම තත්ත්වය ප්‍රාදේශීය මට්ටමෙන් පමණක් නොව මධ්‍යම ආණ්ඩු මට්ටමෙන්ද පැවතීම අත්‍යවශ්‍ය වන්නේය. රාජ්‍යයේ බලය හෙවත් ස්වාධිපත්‍ය බෙදීම පිළිබඳ අවශ්‍යතාව මතුවන්නේ මේ අනුවය. බහුජාතික සමාජයක් පවතින රාජ්‍යයක මෙබඳු තත්ත්වයක් නොපවතී නම් සිදුවන්නේ අසමානත්වයට හා පීඩනයට පත් සුළුජාතීන් විසින් ස්වකීයවූ ජාතික රාජ්‍යයක් ගොඩනැගීමට වෙහෙසීමය. බහුජාතික සමාජයක් පවතින රාජ්‍යයක මහා ජාතියේ දේශපාලන ආධිපත්‍යය ඉස්මතුවීමෙන් සුළුජාතීන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය යටපත්වීම හේතුකොටගෙන පීඩාවට පත්වන සුළු ජාතියක් ස්වාධීන රාජයයක් දිනාගැනීම සඳහා දේශපාලන අරගලයකට අවතීර්ණ වීම ස්වභාවික ප්‍රවණතාවකි. එබඳු ප්‍රවණතා සමනය කරමින් විවිධත්වය තුළ එක්සත් රාජ්‍යයක් ගොඩනැගීම සඳහා සංධීය ක්‍රමය හෙවත් ෆෙඩරල් ක්‍රමය භාවිතයට ගැනීම ලොව බොහෝ රටවල දක්නට ලැබේ. සන්ධීයවාදය ලිබරල්වාදී සිද්ධාන්තයකි. මේ සම්බන්ධයෙන් පවතින මාක්ස්වාදී මතය වඩාත් ප්‍රගතිශීලී මෙන්ම රැඩිකල් ස්වභාවයක් ගනී. මාක්ස්වාදීන්ගේ ස්ථාවරය වන්නේ පීඩිත ජාතියේ "ස්වයං නිර්ණන අයිතිය" *Self Determination* පිළිගැනීමය. ස්වයං නිර්ණන අයිතිය යන්න ප්‍රාදේශික ස්වයං පාලනයේ සිට ස්වාධීන රාජ්‍යයක් ගොඩනගා ගැනීම දක්වා පුළුල් පරාසයක් ගනී.

නිදහස් ශ්‍රී ලංකාවේ දේශපාලන බලය හැසිරවීමේ ක්‍රියාදාමය එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යන ප්‍රධාන සිංහල දේශපාලන පක්ෂ දෙක අතර හුවමාරු වීම හේතුකොටගෙන සුළුජාතික පක්ෂවලට විශේෂයෙන්ම දෙමළ දේශපාලන සංවිධානවලට පාලන බලයට හවුල්වීමේ අවකාශය මිස පාලන බලය හැසිරවීමේ කිසිඳු හැකියාවක් නොතිබීම මෙහිදී විශේෂයෙන් අවධාරණය කළ යුත්තකි. ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක නිශ්චිතවම සිංහල ජාතිය මත පදනම් වූ සංවිධාන වන අතර ඒවාට පුළුල් ආකාරයේ සුළුජාතික පදනම් නොතිබේ. එහෙයින් නිදහසින් පසු යුගයේ මේ රටේ සෑම ආණ්ඩුවකම අවධානය බහුතර සිංහල ජාතියේ උවමනාවන් ඉටුකිරීම කෙරෙහි යොමුවිය. ඇත්ත වශයෙන්ම සුළු ජාතීන්ගේ ජාතික හා ආගමික උවමනාවන් කෙරෙහි මෙන් ම ප්‍රාදේශීකවාදී උවමනාවන් කෙරෙහි කිසිඳු රජයක විශේෂ සැලකිල්ලක් යොමු නොවූ හෙයින් රාජ්‍යමය අවස්ථාලාභයන් සිංහල බහුතරය වෙත හිමිවීමත් සුළු ජාතීන් කොන්වීමත් සිදුවී තිබේ. විශේෂයෙන්ම කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනය පිළිබඳව අවධානය යොමු කිරීමේදී නිදහසින් පසු කිසිඳු කෘෂිකාර්මික සංවර්ධන යෝජනා ක්‍රමයක් උතුරු පළාතේ ක්‍රියාත්මක නොවීය. නිදහසින් පසු මේ රටේ ඇති කරන ලද විශාලතම බහුකාර්ය යෝජනා ක්‍රමය වන මහවැලි යෝජනා ක්‍රමය මගින් ද උතුරු පළාතෙහි සංවර්ධනයට කිසිදු බලපෑමක් සිදුනොවීය. එමෙන්ම කාර්මික ව්‍යාප්තිය සලකා බැලීමේදී පැහැදිලි වනුයේ විශේෂයෙන්ම උතුරු පළාත තුළ කර්මාන්ත ඉතා සුළු වශයෙන් ස්ථාන ගත වී ඇති බවය. කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් ද රජය වැඩි සැලකිල්ලක් යොමු කළේ සිංහල බහුතරය වෙසෙන ප්‍රදේශ කෙරෙහිය. 1978 දී ආරම්භ වූ නිදහස් ආයෝජන ප්‍රවර්ධන කළාපයන් සියල්ලක්ම සිංහල බහුතරය වෙසෙන ප්‍රදේශවලට සීමා වූ හෙයින් විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර පළාත්වල අළුත් රැකියා උත්පාදනයක් සිදුනොවීය. මෙයින් වඩාත් අර්බුදයට පත්වූයේ දෙමළ ගැමි සමාජයයි. මෙහිදී සිංහල ගැමි සමාජයේ පවතින අර්බුදය සැලකිල්ලට ගත යුතුය. එනම් සිංහල මෙන්ම දෙමළ ගැමි ජනතාව පොදුවේ මුහුණපාන ගැටළු වශයෙන් ඉඩම් ප්‍රශ්නය, ප්‍රාග්ධන ඌණතාව, ණය ගැති භාවය, විරැකියාව, මන්ද පෝෂණය, ස්වභාෂා අධ්‍යාපනයේ අර්බුදය යනාදිය දක්විය හැක. එහෙත් පසුගිය වකවානුවේදී රජය සුළුජාතීන් කෙරෙහි දක්වූ නොසැලකිල්ල තුළ සුළුජාතීන්ට අසමාන

අයුරින් අවස්ථාලාභයන් හිමිවීම හේතුකොට ගෙන විශේෂයෙන්ම දෙමළ සමාජය (ලාංකීය දෙමළ හා වතු දෙමළ) පීඩනයට පත්වී තිබේ. නිදහසින් පසු යුගයේ ශ්‍රී ලංකාවේ දෙමළ භාෂාව කථාකරන ජනතාව ප්‍රායෝගික තලයෙහි දෙවැනි පුරවැසියන් බවට පත්වී ඇති ආකාරය මෙහිදී සඳහන් කළ යුතුවේ. "ශ්‍රී ලංකාව සිංහල රටක් වේ" යන පිළිගැනීම ඉස්මතු කිරීම හේතුකොට ගෙන සුළු ජාතීන් මෙසේ දෙවන පුරවැසියන් බවට ස්වභාවිකවම පත්වී ඇති අතර මේ තත්ත්වය තුළ සුළුජාතීන්ගේ ආත්මගරුත්වය යටපත්වීම සිදු වී තිබේ.

නිදහසින් පසු යුගයේ මේ රටේ "පාලනය පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියා කලාපයේ" කොටස්කරුවන් හෙවත් හවුල් කරුවන් බවට පත්වීමට සුළුජාතික නියෝජිතයින්ට අවකාශය නොලැබීම පිළිබඳ ගැටළුව ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නයේ මූලික පදනම බවට පත්වී ඇත. රාජ්‍යමය අවස්ථාලාභයන් සුළු ජාතීන්ට අහිමි වූයේ මේ තත්ත්වය හේතුකොට ගෙනය.

නිදහසට පෙර සොල්බරි කොමිසම ලංකාවට පැමිණි අවස්ථාවේදී ලංකා ද්‍රවිඩ සංගමයේ නායක ජී. ජී. පොන්නම්බලම් ඉදිරිපත් කළ එක් ප්‍රධාන යෝජනාවක් වූයේ ව්‍යවස්ථාදායකයේ සමබර නියෝජනය හෙවත් සිංහල හා සුළු ජාතීන්ට සමබර නියෝජනයක් ලබා දීම පිළිබඳ යෝජනාවය. මෙහි පරමාර්ථය වූයේ පාලනය පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා බහුතර සිංහල ජාතියට මෙන්ම සුළුජාතීන්ටද සමාන පදනමක් යටතේ සම්බන්ධ වීමට අවස්ථාව සලසා ගැනීම විය. එසේ නොවුණහොත් පැහැදිළි වශයෙන්ම සිංහල මහාජාතියේ දේශපාලන ආධිපත්‍ය රටතුළ තහවුරු වීම නොවැලැක්විය හැකි දෙයක් වන බව සුළු ජාතික දේශපාලඥයන්ගේ ආකල්පය විය. ඇත්ත වශයෙන්ම නිදහසින් පසු යුගයේ මෙරටෙහි පාලනය පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි කොටස්කරුවන් බවට පත් වීමට සුළු ජාතික නියෝජිතයින්ට අවස්ථාව සැලසෙන ආකාරයේ ව්‍යවස්ථාත්මක රාමුවක් නිර්මාණය වුයේ නැත. විශේෂයෙන්ම දේශපාලන විධායකය තුළ සුළු ජාතික නියෝජිතයින්ට හවුල්කාරීත්වයක් ඇති වීම සඳහා අවශ්‍ය නෛතික විධිවිධාන සැලසීමක් සිදු නොවීය.

1947 සිට 1999 දක්වා කාලපරිච්ජේදයෙහි දේශපාලන විධායකය තුළ (ආමාත්‍ය මණ්ඩලය) සුළු ජාතීන්ට ප්‍රමාණවත් ඉඩ ප්‍රස්තාවක් හිමි නොවීය. පහත සඳහන් සටහන අනුව එය පැහැදිළි වේ.

| කාලය | සිංහල | දෙමළ | මුවර් | වෙනත් | මුළු ගණන |
|---|---|---|---|---|---|
| 1947-1952 | 11 | 02 | 01 | 01 | 14 |
| 1952-1953 | 11 | 02 | 01 | | 14 |
| 1953-1956 | 11 | 02 | 01 | | 14 |
| 1956-1959 | 13 | - | 01 | | 14 |
| 1960-1964 | 10-14 | - | 01 | | 11-15 |
| 1965-1970 | 15 | 01 | 01 | | 17 |
| 1970-1977 | 17-16 | 01 | 01 | 01 | 20-19 |
| 1977-1988 | 21 | 03 | 02 | | 26 |
| 1988-1993 | 19-23 | 01 | 02 | | 22-26 |
| 1993-1994 | 21 | 01 | 02 | | 24 |
| 1994-1999 | 19 | 02 | 02 | | 23 |

(ඉහත සටහන මගින් දක්වා ඇත්තේ නිදහස් ශ්‍රී ලංකාවේ ආණ්ඩු කාල පරිච්ඡේදයන් දළ වශයෙනි. මෙහිදී කෙටිකාලීන ආණ්ඩු සැලකිල්ලට භාජනය නොවිය.)

ඉහත සටහනට අනුව පෙනී යනනේ නිදහස් ශ්‍රී ලංකාවේ දේශපාලන විධායකයන් තුළ සුළු ජාතික නියෝජිතයින්ට ඉතා පටු ඉඩ ප්‍රස්ථාවක් පමණක් ලැබී ඇති බවය. මෙහිදී මතුවන අනික් ප්‍රශ්නය වන්නේ එසේ අමාත්‍ය මණ්ඩලයට පත්වූ දෙමළ හා මුවර් සාමාජිකයින් පවා සැබෑ සුළු ජන නියෝජිතයින් වුවාද යන්නයි. 1947 - 1956 වකවානුවේ ඇමති ධූර දරු සි සුන්දරලිංගම්, ජී. ජී. පොන්නම්බලම්, සී සින්නම්පලම්, 1965 - 1968 වකවානුවේ ඇමති ධුරයක් දරූ එම් තිරුචෙල්වම් සහ 1978 පටන් 1999 දක්වා ඇමති ධූර දරූ එස් තොන්ඩමන් සහ 1994 පටන් අමාත්‍ය ධූරයක් දැරූ අෂ්රොෆ් හැර අනෙක් සියළු සුළු ජාතික ඇමතිවරුන් පැහැදිලි වශයෙන්ම සැබෑ සුළු ජාතික නියෝජිතයින් නොවු අතර ඔවුහු එ. ජා. ප. යේ හෝ ශ්‍රී. ල. නි. ප. යේ ප්‍රබල ආධාර කරුවන් වූහ. මතු සඳහන් කළ දෙමළ හා මුවර් ඇමති වරුන් කීපදෙනා මෙතෙක් දෙමළ ජනතාවගේ හා මුවර් ජනතාවගේ ඡන්දයෙන් පත්වූ දෙමළ හා මුවර් දේශපාලන සංවිධානවල නියෝජිතයින් වීම වැදගත්ය. මෙම තත්ත්වය හේතු කොට ගෙන නිදහස් ශ්‍රී ලංකාවේ බලය හැසිරවීම පිළිබඳ කාර්යභාරයට බලපෑම් සහගත ලෙස හවුල් වීමේ අවසථාව මේ රටේ සුළු ජාතික දේශපාලඥයින්ට අහිමි වී තිබේ. විශේෂයෙන්ම උතුරු - නැගෙනහිර දෙමළ හා මුස්ලිම් ප්‍රදේශ මෙන්ම වතුකරයේ දෙමළ ජනතාව වාසය කරන ප්‍රදේශ වල භෞතික සංවර්ධනය මන්දගාමී වීම කෙරෙහි. සැබවින්ම මෙකී තත්ත්වය හේතු විය.

නිදහසින් පසු යුගයේ ලංකා රජය පාලන කටයුතු ක්‍රියාත්මක කළේ හුදු සිංහල බෞද්ධ රජ්‍යයක් වශයෙනි. එමගින් පනවනු ලැබූ ඇතැම් නිති මගින් මේ රටේ සුළු ජාතීන්ට අසමානත්වයක් මෙන්ම පීඩනයක් ඇති කරන ලදී. 1948 - 1949 වකවානුවේදී එවකට පැවති එක්සත් ජාතික පක්ෂ රජය විසින් පනවනු ලැබූ පුරවැසි පණත් මාර්ගයෙන් මෙරටෙහි ඉන්දීය සම්භවයක් ඇති වතු කම්කරුවන් දශලක්ෂයක පමණ පුරවැසි භාවය අහෝසි විය. එම පුරවැසි පණත් වලට රජය තුළ සිටි ලංකා ද්‍රවිඩ සංගමයේ ඇමතිවරුන් සහය දක්වීම පිළිබඳ චෝදනාව එල්ලකරමින් 1949 දී එස්. ජේ. වී. චෙල්වනායගම් ප්‍රමුඛ කණ්ඩායමක් ද්‍රවිඩ සංගමයෙන් බිදී ගොස් ෆෙඩරල් පක්ෂය පිහිටුවා ගත්තේය. එම අවස්ථාව මෙරටේ දෙමළ ජාතිවාදී දේශපාලනයේ සංවර්ධනාත්මක සංධිස්ථානයක් සළකුණු කළේය. එහෙත් ෆෙඩරල් පක්ෂය ක්‍රියා කළේ වතු කම්කරුවන්ගේ අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා නොවන අතර එහි මුලික අරමුණ වුයේ උතුරු - නැගෙනහිර ලංකා දෙමළ ජනතාව වෙසෙන ප්‍රදේශ සඳහා ෆෙඩරල් පාලනයක් හෙවත් ප්‍රාන්තීය ක්‍රමයක් දිනාගැනීම විය.

1956 දී "සිංහල පමණක්" නැමති සටන් පාඨය තුළින් ආණ්ඩුබලය දිනාගත් එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායකගේ නායකත්වයෙන් පැවති මහජන එක්සත් පෙරමුණ ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරනු ලැබු සිංහල රාජ්‍ය භාෂා පණත මේ රටේ සිංහල දෙමළ මතභේදය වඩාත් උග්‍ර අතකට පත් කිරීම කෙරෙහි ඉවහල් විය. ලංකාවේ ජාතික ප්‍රශ්නය මතුපිටින් විශද වුයේ භාෂා ප්‍රශ්නයක් වශයෙනි. සිංහල රාජ්‍ය භාෂා පණත හේතු කොටගෙන සිංහල භාෂාව ප්‍රමුඛත්වයට පත්වීමෙන් ද්‍රවිඩ භාෂාවට නෛතික වශයෙන් හිමිවුයේ දෙවැනි ස්ථානයකි. එමෙන්ම බුද්ධාගමට රාජ්‍ය

අනුග්‍රහය ලබා දීම මේ සමගම සිදුවූ අතර එමගින් අනිකුත් ආගම් ද්විතික තත්ත්වයකට පත්විය. ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ අධිපතිවාදයට මෙසේ රාජ්‍ය අනුග්‍රහය අත්වීම හේතු කොටගෙන සිංහල බෞද්ධ ආධිපත්‍යයට තමන් යටපත් වනවාය යනුවෙන් මේ රටේ සුළු ජාතීන් තුළ පැවති ආකල්පය වඩාත් තහවුරු වුයේය. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත්වීමෙන් රාජ්‍ය සේවයෙහි සිංහල භාෂා ප්‍රවීනත්වය උසස්වීම සඳහා අවශ්‍ය වීම සෘජු ලෙසම රාජ්‍ය සේවය තුළ සුළු ජාතීන්ට අසාධාරණ අයුරින් බලපෑවේය.

1957 දී උතුරු - නැගෙනහිර පලාත් සඳහා ෆෙඩරල් පාලනයක් ඇතිකර ගැනීම මුල්කරගෙන ගිවිසගත් බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම සිහල ජාතීවාදී ප්‍රහාරය හමුවේ පරාජයට පත් වු අතර 1958 දී ඇති වු ප්‍රථම සිංහල - දෙමළ කෝලාහලය මෙරටෙහි ඇතිවු ප්‍රථම සිංහල - දෙමළ ජාතිවාදී ගැටුම විය. ශ්‍රී ලංකාවේ ජාතික අර්බුදයේ ප්‍රවේශය සුදුවුයේ මේ ආකාරයෙනි.

1965 දී බලයට පත්වූ ඩඩ්ලි සේනානායක ගේ එ. ජා. ප. ය ප්‍රමුඛ ජාතික පෙරමුණ තුළ ෆෙඩරල් පක්ෂයද කොටස් කරුවෙක් වු බැවින් 1967 දී ඩඩ්ලි - චෙල්වනායගම් ගිවිසුම් තුළින්උතුරු - නැගෙනහිර ෆෙඩ්රල් ක්‍රමය පිළිබඳ ව්‍යාපෘතිය යලිත් දේශපාලන කරලියට අවතීර්ණ විය. එය රට සහා පණත නම් වේ. එහෙත් රට සහා පණතද සිංහල ජාති වාදී ප්‍රහාරය හමුවේ අවලංගු වී ගියේය. බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුමට එරෙහිව සිංහල බෞද්ධ ජාතිවාදී බලවේග අවදි කිරීම සම්බන්ධයෙන් එ. ජා. ප. ය පෙරමුණගත් අතර 1967 ඩඩ්ලි - චෙල්වනායගම් ගිවිසුමට එරෙහිව සිංහල ජාතිවාදය අවදි කිරීමට පෙරමුන ගත්තේ ශ්‍රී. ලං. නි. ප. ය ප්‍රමුඛ සාම්ප්‍රදායික වාමාංශයයි. කෙසේ වෙතත් 1960 දශකය අවසාන වන විට ද්‍රවිඩ ප්‍රදේශ සඳහා ෆෙඩරල් ක්‍රමය විසඳුමක් වශයෙන් යොදා ගැනීමේ උත්සහයන් අසාර්ථක වී තිබුණි.

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මේ රටේ ජාතික ප්‍රශ්නය තව දුරටත් අර්බුදකාරී තත්ත්වයකට පත්කරන ලදී. 1972 ව්‍යවස්ථාව මගින් ෆෙඩ්රල් වාදය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරමින් ඒකීය රාජ්‍ය නිශ්චිත වශයෙන් තහවුරු කිරීම සිදුවිය. මෙම තත්ත්වය දෙමළ ජාති වාදය වෙත. එල්ල කරනලද ප්‍රබල ප්‍රහාරයක් විය. 1972 ව්‍යවස්ථාව මගින් සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවටත් බුද්ධාගම රාජ්‍ය ආගම බවටත් පත් කිරීම තුළින් විශේෂයෙන්ම ද්‍රවිඩ භාෂාවද හින්දු. මුස්ලිම් හා ක්‍රිස්තියානි වැනි ආගම්ද රටේ මුලික නීතියෙන් දෙවැනි තැනකට පත්කිරීම සිදු කෙරුණි. ඇත්ත වශයෙන්ම 1972 ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව වූ කලී සිංහල - බෞද්ධ සමාජ - දේශපාලන ආධිපත්‍යයේ පිළිබිඹුවක් විය. බහු ජාතික සමාජයක් පවත්නා රටක මුලික නීතිය මගින් මෙසේ එක් භාෂාවකට හා ආගමකට පමණක් විශේෂ ස්ථානයක් ලබාදීම, භාෂාමය හා ආගමික අසමානතාව නෛතික වශයෙන් පිළිගැනීමක් හා තහවුරු කිරීමක් වන්නේය.

එමෙන්ම 1972 පටන් උසස් අධ්‍යාපනය සඳහා සිසුන් තෝරා ගැනීම සම්බන්ධයෙන් ප්‍රමිතිකරණය හඳුන්වා දුන් අතර එමගින් විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීම ජාතික අනුපාතය අනුව සිදු කිරිමට පියවර ගැනීමෙන් මෙතෙක් සුළු ජාතික කොටස් වලට හිමි වූ උසස් අධ්‍යාපනික අවස්ථා ලාබයන් සීමාවීමට පටන් ගත්තේය. නිදසුන් වශයෙන් 1973 දී ඉන්ජිනේරු පීඨයට අතුළත් වූ දෙමළ සිසුන් ප්‍රමාණය 24.4% වූ අතර 1974 දී එම ප්‍රමාණය 16.3% දක්වා ද වෛද්‍ය පීඨයට ඇතුලත් වු දෙමළ සිසුන් ප්‍රමාණය 1973 දී 36.9% ක් වුවද 1974 දී එම ප්‍රමාණය 25.9% දක්වා ද1975 දී එම ප්‍රමාණය 17.4% දක්වා ද පහළ ගියේය.මේ ආකාරයෙන් විශේෂයෙන්ම උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අවස්ථාවන් සීමාවීම උතුරු - නැගෙනහිර තරුණ අසහනකාරිත්වය කෙරෙහි බලපෑ ප්‍රබල සාධකයක් විය.

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කළ ඒකීය සංකල්පයටත්, සිංහල - බෞද්ධ අධිපතිවාදය රටේ මුලික නීතිය මගින් තහවුරු කිරීමටත්, රාජ්‍ය සේවය තුළ මෙන්ම උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සුළු ජාතින්ට සිදු වූ අසාධාරණයටත් එරෙහිව උතුරු නැගෙනහිර ප්‍රදේශවල දේශපාලන විරෝධතා ව්‍යාප්තියක් 1972 න් පසු කාලයේදී උස්සන්නවීමට පටන් ගත් අතර රජය ඊට ප්‍රතික්‍රියා කළේ මර්දනය මුදා හැරීම තුළිනි. මේ තත්ත්වය යටතේ ද්‍රවිඩ ජාතික දේශපාලනයේ ප්‍රධාන තේමාව වූ ෆෙඩරල් ඉල්ලීම ක්‍රමයෙන් ක්ෂයවී යමින් උතුරු - නැගෙනහිර ප්‍රදේශය සඳහා ස්වාධීන දෙමළ රාජ්‍යයක් දිනා ගැනීම අරමුණු කරගත් දේශපාලන ව්‍යාප්තිය ඉස්මතු වීමට පටන් ගැනුනේය. උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හී ක්‍රියාත්මක වු ෆෙඩ්රල් පක්ෂය, ද්‍රවිඩ සංගමය හා අනෙකුත් දේශපාලන සංවිධාන ඒකාබද්ධ වීමෙන් 1775 දී ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ පිහිටවූ අතර එහි මුලික අරමුණ දෙමළ ඊලාම් රාජ්‍යය දිනාගැනීම විය. 1977 මහා මැතිවරණයේදී උතුරු - නැගෙනහිර පළාත්වල ඡන්ද කොට්ඨාස 24 ක් සඳහා තරඟ කළ ද්‍ර. එ. වි. පෙ. ට ඉන් ආසන 18ක් ජය ගැනීමට හැකිවූ අතර වලංගු මුළු ඡන්ද සංඛ්‍යාවෙන් 6. 75% ක් එය විසින් හිමි කරගන්නා ලදී. 1977 දී පිහිටවු පාර්ලිමේන්තුවේ ප්‍රධාන විපක්ෂ කණ්ඩායම ද්‍ර. එ. වි. පෙ. වීම තවත් වැදගත් සිදුවීමකි. එහෙයින් ඒ අමිර්තලිංගම් වෙත විරුද්ධපක්ෂ නායකත්වය හිමිවිය.

1978 ස්ථාපිත වු දෙවන ජනරජ ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකාවේ දේශපාලන ගමන්මග වෙනස් කරමින් විධායක ජනාධිපති ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. එම ව්‍යවස්ථාවට අනුව තව දුරටත් සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවටත්, බුද්ධාගම රාජ්‍ය ආගම බවටත් පත්කිරීම තුළින් 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව මගින් ඇතිකරන ලද සිංහල බෞද්ධ අධිපතිවාදය අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේය. අනෙක් අතට විධායක ජනාධිපති ක්‍රමය යනු වඩාත් සංකේන්ද්‍රගත ආණ්ඩුක්‍රමයක් වේ. එමගින් ප්‍රජාතන්ත්‍රවාදයට ප්‍රබල තර්ජනයක් එල්ල විය.

1977 දී එ. ජා. ප. ආණ්ඩුව ශ්‍රී ලංකාවේ මෙතෙක් පැවති සංවෘත ආර්ථිකය වෙනුවට විවෘත ආර්ථිකයක් ස්ථාපිත කළ අතර එමගින් ආනයන - අපනයන වෙළඳාම නිදහස් කරන ලදී. විශේෂයෙන්ම උතුරු පළාතේ නිෂ්පාදිත කෘෂි භෝගයන්ට දකුණේ මෙතෙක් පැවති වෙළඳපොල විවෘත ආර්ථිකය තුළින් අහිමි වී ගියේය. මූලික වශයෙන් කෘෂි ආර්ථිකයට හැඩගැසී සිටි දෙමළ ගැමි ජනතාව විවෘත ආර්ථිකයෙන් ප්‍රබල ලෙස බැට කෑවේය.

1980 දශකය ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නය වඩාත් අර්බුදකාරී තත්ත්වයට පත්කල දශකයක් විය. විශේෂයෙන්ම උතුරු නැගෙනහිර ප්‍රදේශවල ජාතික ප්‍රශ්නය හේතුකොට ගෙන සිවිල් යුද්ධමය වාතාවරණයක් උද්ගත වීම 1980 දශකයේ මුල් වකවානුවේ පටන් සිදුවිය.

ස්වාධීන දෙමළ ඊලාම් රාජ්‍යය දිනා ගැනීමේ සටන් පාඨය තුළින් උතුරු - නැගෙනහිර පලාත්වල පාර්ලිමේන්තු ආසන ජයගත් සම්ප්‍රදායික දෙමළ ජාතික නායකත්වය කෙරෙහි කලකිරුණු දෙමළ තරුණ රැඩිකල් කොටස්

සන්නද්ධ අරගලයක් තුළින් දෙමළ ඊලාම් රාජ්‍ය යථාර්ථයක් බවට පත්කර ගැනීම සඳහා සංවිධානය වීම ඇරඹුණේ 1978 වැනි කාලයේය.

එසේ සංවිධානය වූ ද්‍රවිඩ තරුණ ව්‍යාපාරය ක්‍රමයෙන් ටෙලෝ *(TELO)*, ප්ලොට් *(PLOT)* දෙමළ ඊලාම් කොටි *(L.T. T. E)* ඊරොස් *(EROS)* ඊලාම් ජනතා විප්ලවකාරී පෙරමුණ *(E. P. R. L. F.)* වශයෙන් කණ්ඩායම් කීපයකට බෙදී ගිය අතර එම කණ්ඩායම් අතුරින් යුධමය වශයෙන් වඩාත් ඉස්මතු වූයේ එල්. ටී. ටී. ඊ සංවිධානයයි. එහි නායකත්වයට පත්වූයේ වේලුපිල්ලේ ප්‍රභාකරන්ය. අනෙකුත් සියළුම දෙමළ තරුණ සන්නද්ධ කණ්ඩායම් අභිබවමින් එල්. ටී. ටී. ඊ සංවිධානය ගරිල්ලා උපක්‍රමය යොදා ගනිමින්. ක්‍රමාණුකූලව යුධමය සංවිධානයක් වශයෙන් වර්ධනය වූයේ දෙමළ ජනතාවගේ දැවෙන ප්‍රශ්න පෙරටුකර ගනිමිනි. 1980 දශකය තුළ එම සංවිධානය අතිශයින් ව්‍යාප්ත වීමෙත් ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත් වීමක් සිදු විය.

දෙමළ ජාතික සන්නද්ධ අරගලය ක්‍රමානුකූලව උත්සන්න වීම කෙරෙහි පැහැදිලි වශයෙන්ම ශ්‍රී ලංකා රජය විසින් පනවනු ලැබූ මර්ධන කාරී නීති අණ පණත් බලපෑවේය. 1978 සම්මත කළ "ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය හා ඒ හා සමාන වූ වෙනත් සංවිධාන තහනම් කිරීමේ පණත" 1979 දී සම්මත වූ "ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත" යනාදිය දැක්විය හැකිය.

මෙසේ දෙමළ ජනතාව කෙරෙහි බලපාන මර්දනකාරී නීති පැනවීම එක් අතකිනුත් අනෙක් අතින් හමුදා - පොලිස් මර්දනය ප්‍රායෝගික වශයෙන් දියත් කිරීමත් හේතුකොට ගෙන 1980 දශකය ආරම්භ වන විට උතුරු - නැගෙනහිර සිවිල් යුද්ධය දළුලා වැඩෙන්නට විය. 1981 සංවර්ධන සභා මැතිවරණයේදී එවකට පැවති එක්සත් ජාතික පක්ෂ රජය විසින් යාපනය ප්‍රදේශයේ ගෙන ගිය දූෂණ හා භීෂණකාරී ක්‍රියාවලිය විශේෂයෙන්ම යාපනය පුස්තකාලය ගිණිතැබීමේ සිද්ධිය හේතුකොට ගෙන දෙමළ ජනතාව තුළ කොළඹ ආණ්ඩුව කෙරෙහි මෙතෙක් පැවති අවිශ්වාසය හා අපැහැදීම වඩාත් තීව්‍ර වීම සිදු විය.

1983 ජූලි මාසයේදී රජයේ හමුදා සොල්දාදුවන් 13න් දෙනෙක් ද්‍රවිඩ සටන්කාමීන් විසින් ඝාතනය කරනු ලැබීමේ ප්‍රතිඵල වශයෙන් වශයෙන් දකුණේ සිංහල ප්‍රදේශවල අතිශයින් දරුණු ස්වභාවයේ ද්‍රවිඩ විරෝධයක් ඉස්මතු වීමෙන් දවැන්ත ගණයේ දෙමළ ජන ඝාතනයක් සිදුවිය. උතුරු - නැගෙනහිර ආයුධ සන්නද්ධ ව්‍යාපාරය මෝරායැම කෙරෙහි එම සාධකය සෘජු වශයෙන් බල පෑවේය. මේ කාලයේදී පනවන ලද 6 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ඒකීය රාජ්‍ය වෙනුවෙන් දිවුරුම් දීමට පැනවූ නීතිය ප්‍රතික්ෂේප කළ පාර්ලිමේන්තුවේ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන්ගේ පාර්ලිමේන්තු ආසන අහෝසි විය. මේ අනුව පාර්ලිමේන්තුවේ දෙමළ නියෝජනයද අභිමිවී ගියේය. 1983 ජූලි මාසයේ ඇති වූ සිංහල - දෙමළ ජාතිවාදී භීෂණයෙන් අනතුරුව ලංකාවේ ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් විදේශීය මැදිහත්වීම් සිදුවීමට පටන් ගැනුනි. විශේෂයෙන්ම අසල්වැසි ඉන්දියාවේ බලපෑම් වඩාත් කැපී පෙනෙයි. ඇත්ත වශයෙන්ම 1983 ට පෙර සිටම ඉන්දියානු රජය උතුරු - නැගෙනහිර දෙමළ සන්නද්ධ ව්‍යාපාරයට නිශ්චිත වශයෙන් සහය දැක්වීමක් සිදු වූ අතර ඉන්දියානු රජයේ එම ස්ථාවරය කෙරෙහි බලපෑවේ 1977 බලයට පත්වූ එක්සත් ජාතික පක්ෂ රජය විසින් අනුගමනය කරනු ලැබූ ඉන්දියානු විරෝධී විදේශ ප්‍රතිපත්තියයි. කෙසේ වෙතත් ඉන්දියානු රජය 1983 න් පසු සෘජු වශයෙන් ලංකාවේ උතුරු - නැගෙනහිර දෙමළ ජාතික ප්‍රශ්නය කෙරෙහි මැදිහත් වීමට පටන් ගන්නා ලදී. එම මැදිහත්වීමේ තීරණාත්මක අවස්ථාව වූයේ 1987 ජූලි මාසයේ ඉන්දියානු රජය හා ලංකා රජය අතර ඉන්දු - ලංකා ගිවිසුම ඇති වීමය. පළාත් සභා ක්‍රමය එම ගිවිසුමේ ප්‍රතිඵලයක් විය. ලංකාවේ සුළු ජාතික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් වශයෙන් පළාත් සභා යටතේ බලය විමධ්‍යගත කිරීමේ ක්‍රියා මාර්ගය උපයෝගි කර ගැනුනි. මේය ඒකීය රාමුවක් තුළ බලය බෙදීමක් වශයෙන් ඇතැමුන් තර්ක කරන නමුත් පළාත් සභා ක්‍රමය මගින් ලංකාවේ ස්ථාපනය වූයේ අර්ධසන්ධීය ක්‍රමයකි. කෙසේ වෙතත් පළාත් සභා මගින් බලය බෙදීමේ ක්‍රියාවලියට යම් ප්‍රවේශයක් ඇති විය. එහෙත් ඇත්ත වශයෙන්ම එමගින් මේ රටේ සුළු ජාතික ප්‍රශ්නයට කිසිදු විසඳුමක් නොලැබුණි. 1988 - 1990 කාල පරිච්ඡේදයෙහි උතුරු - නැගෙනහිර පළාත් සභාව ක්‍රියාත්මක විය. ඊ. පි. ආර්. එල්. එෆ් සංවිධානය එම පළාත් සභාවේ බලය දැරූ අතර ආරම්භයේ පටන්ම එල්. ටී. ටී . ඊ සංවිධානය බලය බෙදීමේ ක්‍රියාදාමය ප්‍රතික්ෂේප කරන ලදී.

ශ්‍රී ලංකාවේ බලය බෙදීමේ ක්‍රියා දාමය පළාත් සභා ක්‍රමය තුළින් ආරම්භ වුවද 1990 දී ප්‍රේමදාස රජය විසින් උතුරු- නැගෙනහිර පලාත් සභාව විසුරුවා හැරීමෙන් පසු පළාත් සභා ක්‍රමය සිංහල බහුතරය වෙසෙන ප්‍රදේශවලට පමණක් සීමා විය. වර්තමානයේදී පලාත් සභා ක්‍රමයේ මූලික අරමුණ වූ ජාතික ප්‍රශ්නය විසඳීම නැමති දේශපාලන අරමුණ එය වෙතින් ගිලිහී ගොස් තිබේ.

1980 දශකය මුල් වකවානුවේ ඇරඹුණු උතුරු - නැගෙනහිර සිවිල් යුද්ධය මේ වන තෙක්ම අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර එල්. ටී. ටී. ඊ සංවිධානය හා රජයේ සන්නද්ධ හමුදාවන් අතර ජය පරාජය දෝලනය වෙමින් අතිවිශාල ජීවිත හා දේපල විනාශයක් සිදුවෙමින් පවතී. උතුරු නැගෙනහිර ප්‍රදේශයන්ට පමණක් සීමා වී තිබූ යුද්ධ බිය වර්තමානයේ දී දකුණේ සිංහල ජන සමාජය තුළ ද පැතිරෙමින් ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රමය දැඩි අස්ථාවරයකට ඇද දමා තිබෙන අතර සමස්ථ සමාජ - ආර්ථික ක්‍රමය පරිහානියට පත්වෙමින් පවතී. අද සිදුවෙමින් ඇති යුද්ධය මේ රටේ සුළු ජාතික ප්‍රශ්නයේ සෘජු ප්‍රතිඵලයක් වන බැවින් යුද්ධය නිම කොට ස්ථිරසාර සාමයක් උදා කළ හැක්කේ ජාතික ප්‍රශ්නය විසඳීමේ ක්‍රියාදාමය තුළින් පමණකි. ජාතික ප්‍රශ්නය විසඳීම මූලික වශයෙන් සමානාත්මතා පදනමක මත සිදුකළ යුතු වේ. දිගුකාලීන ලාංකීය සමාජය තුළ ජාතික ප්‍රශ්නය උද්ගත වීම කෙරෙහි බලපෑ හේතු සාධක නිශ්චිත අයුරින් අහෝසි කිරීමෙන් තොරව ජාතික ප්‍රශ්නයට සැබෑ විසඳුමක් නොලැබෙන අතර මතුපිටින් පමණක් ඇති කරන්නා වූ විසඳුම් හුදු තාවකාලික වන්නේය.

වර්තමානයේදී වහා අවශ්‍ය ක්‍රියා මාර්ගය වන්නේ යුද්ධය අත්හිටුවීමය. ඒ සඳහා යුද්ධයේ පාර්ශ්වකරුවන් දෙදෙනා වන රජයේ හමුදාවන් හා එල්. ටී. ටී. ඊ සංවිධානය විසින් එදිරිවාදිකම් අත්හිටවීමේ එකඟතාවකට පත්විය යුතුවේ. ඉන්පසු එල්. ටී. ටී. ඊ සංවිධානයද හවුල් කර ගනිමින් සාම ක්‍රියා මාර්ගය තහවුරු කර ගැනීමටත්. දේශපාලන විසඳුම් කරා ප්‍රවිෂ්ඨ වීමටත් පියවර ගත යුතුය. එල්. ටී. ටී. ඊ සංවිධානය හුදු ත්‍රස්තවාදී සංවිධානය ලෙස හංවඩු ගසමින් එම සංවිධානය සමග කිසිදු සංවාදයක්

ඇති කර නොගතයුතු යැයි ඉදිරිපත්වී ඇති සිංහල ජාතිවාදී මතය හරසුන් ඒකපාර්ශ්වික මතයකි. එල්. ටී. ටී. ඊ සංවිධානය අර්ධ ෆැසිස්ට් ලක්‍ෂණවලින් යුත් සංවිධානයක් වන බව සත්‍යයක් වුවද එය පැහදිලි වශයෙන්ම දෙමළ ජාතික විමුක්තිය වෙනුවෙන් පෙනී සිටින දේශපාලන සංවිධානය වේ. එහි අඛණ්ඩ පැවැත්ම ඇති වී තිබෙන්නේ එහෙයිනි. ලෝකයේ ඕනෑම විමුක්තිකාමී සංවිධානයක් යම් ආකාරයකින් ත්‍රස්ත්‍රවාදී උපක්‍රම භාවිතා කරන බව මෙහිදී සඳහන් කළ යුතුව තිබේ. එයට හේතුව එල්. ටී. ටී. ඊ වැනි දේශපාලන සංවිධානයන් කම්කරු පන්ති පදනමක් නොමැති හුදු රැඩිකල් තරුණ සංවිධානය වීමය. ඇත්ත වශයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ ද මෙබඳු ස්වභාවයක් දරණ බව කිව යුතුය. එහෙයින් වර්තමායේදී උතුරු නැගෙනහිර පමණක් නොව යම් ආකාරයකින් වතුකරයේද දෙමළ රැඩිකල් දේශපාලනයේ සංකේතය වශයෙන් ක්‍රියාත්මක වන්නේ එල්. ටී. ටී. ඊ සංවිධානය වන බැවින් විශේෂයෙන්ම සාම ක්‍රියා මාර්ගයට පිවිසිමේදී යුද්ධයේ ප්‍රධාන පාර්ශ්ව කරුවෙක් වන එල්. ටී. ටී. ඊ. ය සමග සෘජු වශයෙන් සම්මුතියකට එළඹීම අනිවාර්ය වන්නකි. එබඳු සම්මුතියකින් තොරව කිසිසේත්ම තාවකාලික සාමයක් හෝ ඇති නොවන්නේය. විශේෂයෙන්ම ජාතික ප්‍රශ්නයට විසඳුම් සෙවීමේදී සුළු ජාතික සංවිධාන සමග ඉතා පුළුල් සංවාදයකට ගමන් කිරීමේ අවශ්‍යතාව ප්‍රභලය.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රය ප්‍රතිසංවිධානය කිරීම ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ හැකි ප්‍රධානතම විසදුමකි. 1947 පටන් අඛණ්ඩව ක්‍රියාත්මක වන නෛතික රාමුව මූලික වශයෙන් වෙනස් කිරීම මින් අදහස් කෙරේ. ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගයන් දළවශයෙන් පහත සඳහන් පරිදිවේ.

*1) මධ්‍යම ආණ්ඩුව ප්‍රතිසංවිධානය කිරීම.*

*i. 1987 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සිදුකළ 13 වැනි සංශෝධනය මගින් සිංහල හා ද්‍රවිඩ යන භාෂා දෙක රාජ්‍ය භාෂාවන් බවටත් ඉංග්‍රීසි සන්දාන භාෂාව බවටත් පත් කරන ලදී. මෙසේ මූලික නීතිය මගින් භාෂාවන්ට ලබා දී ඇති සම තැන ප්‍රායෝගික යථාර්ථයක් බවට පත් කිරීමට රජය පියවර ගත යුතුය. එනම් රජයේ සියළු කටයුතුවලදී භාෂා තුනම සමාන ලෙස භාවිතා වීම.*

*ii. රාජ්‍ය ලෞකිකභාවයට (Secular State) පත් කිරීම හෙවත් රාජ්‍ය ආගමෙන් ව්‍යුක්ත කිරීම මෙහිදී කිසිදු ආගමකට රජයේ විශේෂ අනුග්‍රහයක් ලබා නොදීම මගින් සමානාත්මතාව තහවුරු කිරීම.*

*iii. සංවර්ධන හා සමාන සුභ සාධන කාර්යයේදී රටේ සෑම ප්‍රදේශයකටම සම අවස්ථා සැලසෙන අයුරින් නෛතික විධිවිධාන සැලසීම.*

*vi. ප්‍රාද්ශීය ස්වයං පාලන ඒකක වලට මධ්‍යම ආණ්ඩුව තුළ නියෝජනයක් (සමබර නියෝජනයක්) ඇති කිරීම සඳහා ද්විමණ්ඩලික ව්‍යවස්ථාදායකයක් ස්ථාපිත කිරීම.*

*v. ජාතීන් අතර සමානාත්මතාව පිළිබඳ මූලධර්මය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කිරීම සහ එය ප්‍රායෝගික වශයෙන්ද තහවුරු කිරීම.*

*2) ප්‍රාදේශිය ස්වයං පාලනය ස්ථාපනය කිරීම (Self Autonomy)*

*i. ප්‍රාදේශිය වශයෙන් පුළුල් බලතල සහිත ප්‍රාන්තීය ඒකක ක්‍රමයක් තහවුරු කිරීම. ප්‍රාදේශීය සංවර්ධනය, පරිපාලයන, අධ්‍යාපනය, ප්‍රාථමික අධිකරණ, පොලිසිය වැනි බල තල එම ප්‍රාදේශීය ඒකක වෙත පැවරීම.*

*ii. මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්තීය ඒකකයන් අතර සම්බන්ධය තහවුරු කෙරෙන්නා වූ විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම.*

දළ වශයෙන් ඉහත සඳහන් කළ පරිදි ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රය ප්‍රතිසංවිධානය කිරීමේ හැකියාව වත්මන් පාලක පැලැන්තියට නොපැවතිවීම පිළිබඳ ගැටළුව මීළඟට ඉස්මතු වන්නකි. ඇත්ත වශයෙන්ම නිදහස් ශ්‍රී ලංකාවේ බලය හැසිරවීමේ ක්‍රියාදාමය හෙවත් දේශපාලන ආධිපත්‍ය දේශිය ධනපති පන්තික නියෝජිතයිනගේ ඒකාධිකරණයක් බවට පත්වී ඇති තත්ත්වය තුළ ජාතික ප්‍රශ්නය විසඳීම නැමති ප්‍රජාතන්ත්‍රවාදී කාර්යභාරය තහවුරු කිරීමේ හැකියාව එම පාලක පැලැන්තියට පවතීද යන ප්‍රශ්නය පැන නැගී අධිරාජ්‍යවාදයෙන් මිදීම ප්‍රජාන්ත්‍රන්ත්‍රවාදය ස්ථාපිත කිරීම කෘෂිකාර්මික ප්‍රශ්නය විසඳීම හා ජාතික ප්‍රශ්නය විසඳීම වැනි ප්‍රජාතන්ත්‍රවාදී කාර්යභාරයන් දියුණු ධනේශ්වර රාජ්‍යයන් සාක්‍ෂාත් කරනු ලැබුවේ නූතන යුගය ආරම්භයේදී ධනපතිපන්තියේ මැදිහත් වීමෙනි. එහෙත් ශ්‍රී ලංකාව ඇතුළු යටත් විජිත වශයෙන් පැවති අඩු දියුණු ධනේශ්වර රාජ්‍යයන්හී අධිරාජ්‍යවාදයේ බලපෑම හේතු කොට ගෙන ස්වාධීන ජාතික ධනපති පන්තියක් බිහි නොවූ අතර එම රටවල බිහි වූයේ අධිරාජ්‍යගැති දේශීය ධනපති පංතියකි. එම දේශීය ධනපති පන්තියට අධිරාජ්‍යවාදයේ බැමිවලින් නිශ්චිත ලෙස වෙන් වීමේ හැකියාවක් නොපවතී. මක් නිසාද යත් ඔවුන් අධිරාජ්‍යවාදීන්ගේ සෘජු නියෝජිතයින් වන බැවිනි. එහෙයින් යටත්විජිත වශයෙන් පැවති අඩු දියුණු ධනේශ්වර රාජ්‍යයන්හී දේශීය ධනපති පංතියක නියෝජිතයින්ට වන වත්මන් පාලක පැලැන්තියට ප්‍රජාතන්ත්‍රවාදී අවධියේ කාර්යභාරයන් කිසිවක් ඉටුකරලීමේ හැකියාව නොපවතින හෙයින් ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නයද තිරසාර ලෙස විසඳීමේ හැකියාව එම පාලක පැලැන්තියට පවතීද යන්න ගැටළු සහගත ප්‍රශ්නයක් වන්නේය.

---


**Reference**

1 Abenaike, H. B. W., Parliament of Sri Lanka, The Associated News Papers Ltd, Lake House, Colombo (N.D.)

2 Garner, J. W. Political science and Government, The world press private Ltd, (U.K) 1959

3 Jayawardana kumari, Ethnic class conflict in sri Lanka Centre for social Analysis, Colombo 1986

4 Ludowyk, E. F. C, The modern History of ceylon, New York 1966

5 Vaidik, V. P, Ethnic Crisis in Sri Lanka: India`s Option, National Publishing, House, New Delhi, 1986

6 Wood ward C.A, The Growth Brown Univarcity Press, Provdence 1969.

7 Wisnon, A. J, Electoral Poltics in an Emergent State The Ceylon Genaral Election of May 1970, Cambridge Univercity Press. London, 1975

8 ගුනවර්ධන, ලෙස්ලි, භාෂා ප්‍රශ්නය, ජතිවාදය හා ඉදිරි මාවත, සමසමාජ ප්‍රකාශණයකි. ස්ටාර් යන්ත්‍රාලය, කොළඹ. 1958

9 ප්‍රනාන්දු, ලක්සිරි, ජාතික ව්‍යාපාරය, ව්‍යවස්ථා වර්ධනය හා වාමාශික ව්‍යාපාරයේ උපත, දීපානී මුද්‍රණ ශිල්පියෝ හා ප්‍රකාශකයෝ. නුගේගොඩ, කොළඹ,1974

10 ලෙනින් වී. අයි, ජාතික ප්‍රතිපත්ති හා නිර්ධන පන්තියක ජාත්‍යන්තරවාදය, (අනුවාදය දූදිගම වී රුද්දිගු) ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්. 1980.

11 ශන්මුගදාසන්, ඇන්, ලංකා ඉතිහාසය දෙස මාක්වාදී ඇසකින්, සරසවි ප්‍රින්ටස්, කොළඹ, 1972